**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 2.9 කින් වර්ධනය වේ.**

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2018 වර්ෂයේ තෙවන කාර්තුව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

..............................................................................................................

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 තෙවන කාර්තුව (ජුලි, අගෝස්තු, සැප්තැම්බර්) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2018 තෙවන කාර්තුව සඳහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 2.9 කි. මෙම වසරේ තෙවන කාර්තුව සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,431,627 කි. තව ද පසුගිය වසරේ තෙවන කාර්තුවේ දී මෙම අගය රුපියල් මිලියන 2,362,698 ක් විය.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය පිළිවෙලින් සියයට 7.5 ක්, සියයට 27.4 ක්, සියයට 56.8 ක් සහ සියයට 8.3 ක් ලෙස වාර්තා වේ.

කෘෂිකාර්මික ආර්ථික කටයුතු පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 3.0 ක සෘණ වර්ධනයට සාපේක්ෂව 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 3.3 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. තව ද කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 1.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර සේවා අංශයේ ආර්ථික කටයුතු තවදුරටත් සියයට 3.9 කින් වර්ධනය වී ඇත.

ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු අතුරින් "වී වගා කිරීම" 2017 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා කර තිබූ සියයට 32.8 ක පසුබෑමට සාපේක්ෂව 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 46.9 ක ඉහළ ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එසේ ම මෙම කාර්තුවේ දී "පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව", "වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම", "එළවළු වගා කිරීම", "රබර් වගා කිරීම" , "සත්ව නිෂ්පාදන", "පළතුරු වගා කිරීම" සහ "කුළුබඩු වගා කිරීම" යන කෘෂිකාර්මික ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 11.9 ක්, සියයට 10.6 ක්, සියයට 9.9 ක්, සියයට 5.2 ක්, සියයට 5.1 ක්, සියයට 4.0ක් සහ සියයට 3.1 ක් වශයෙන් සැලකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 2018 තෙවන කාර්තුවේ දී "මිරිදිය ධීවර කටයුතු" සහ "තේ වගා කිරීම" පිළිවෙලින් සියයට 19.1 ක් සහ සියයට 14.9 ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 27.4 ක දායකත්වයක් සපයන කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 1.9 වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී "නිමැවුම් කර්මාන්ත කටයුතු" වාර්තා කර ඇති වර්ධනය සියයට 2.2 කි. ඒ සඳහා "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන" සහ "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" පිළිවෙලින් සියයට 3.7ක් සහ සියයට 3.2ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායක වී ඇත. එසේම "පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන" සහ "අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන" පිළිවෙලින් සියයට 16.7 ක් සහ සියයට 3.9ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී "දැව හා දැවමය නිෂ්පාදන" සහ "කඩදාසි නිෂ්පාදන" යන නිමැවුම් කර්මාන්ත ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 13.1 ක් සහ සියයට 7.5 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම " සහ "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම" පිළිවෙලින් සියයට 3.3ක් සහ සියයට 5.0ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර "පතල් හා කැනීම්" 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 2.2 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. මේ අතර දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.0ක දායකත්වයක් සහිත ඉදිකිරීම් කර්මාන්තය සියයට 2.5 ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 56.8 ක දායකත්වය සපයන සේවා ආර්ථික කටයුතු පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2018 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 3.9 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී "විදුලි සංදේශ සේවා", "මුල්‍ය හා මුල්‍ය අතරමැදි සේවා", "රක්ෂණ සේවා", "තොරතුරු තාක්ෂණ සේවා", "සෞඛ්‍ය සේවා", "ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම", "තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු" සහ "අනෙකුත් පෞද්ගලික සේවා" පිළිවෙලින් සියයට 14.8ක් , සියයට 12.4 ක් , සියයට 8.3 ක්, සියයට 7.5 ක්, සියයට 5.7 ක්, සියයට 5.4 ක්, සියයට 5.0 ක් සහ සියයට 4.8 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. "ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්" සහ "ප්‍රවාහනය" පිළිවෙලින් සියයට 9.0 ක් සහ සියයට 0.7 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2018 තෙවන කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

අයි. ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.